# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

## මාහෝ හන්දියේ යෝජිත දුම්රිය ස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම

**කොන්ත්‍රාත් අංකය - SRS/F. 81086**

01. සාමාන්‍යාධිකාරී (ශ්‍රී ලංකා දුම්රිය සේවය) වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් පහත විස්තර කර ඇති පරිදි මාහෝ හන්දියේ යෝජිත දුම්රිය ස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සුදුසුකම් ලත් සහ යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු මෙමගින් කැඳවනු ලැබේ.

    මාහෝ දුම්රිය ස්ථාන ගොඩනැගිලි ව්‍යාපෘතියට (වර්ග මීටර් 1,052) ස්ථානීය එකලස් කිරීම (site mobilization), කඩාදැමීම් (demolition), පස් වැඩ (earthworks) සහ පෙදරේරු වැඩ සහිත ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් ඉදිකිරීම (reinforced concrete construction) ඇතුළත් වේ. තවද ජලරෝධනය (waterproofing) නිමවුම් කටයුතු (finishes)'පින්තාරු කිරීම, වහල් සෙවිලි කිරීම සහ දොර ජනෙල් සවිකිරීම් මෙයට අයත් වේ. නල පද්ධති (plumbing) සනීපාරක්ෂක සහ විදුලි පද්ධති සමගින් පඩිපෙළ, බෑවුම් සහිත කැණීම් (ramps) සහ දුම්රිය ස්ථාන පහසුකම් වැනි අතිරේක කාර්යයන්ද මෙයට ඇතුළත් කර ඇත.

02. ඉදිකිරීම් කාල සීමාව දින 300 කි.

03. ලංසුකරණ ක්‍රියාවලිය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (National Competitive Bidding Procedure) හරහා සිදු කරනු ලැබේ.

04. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලැබීමට නම්, සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවූ අයෙකු විය යුතු අතර පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය.
    - ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) C4 හෝ ඊට ඉහළ ශ්‍රේණියේ ලියාපදිංචි වී තිබීම.
    - 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත්තු පනතේ 8 වැනි වගන්තියට අනුකූලව පොදු කොන්ත්‍රාත්තු රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ලංසුකරු සතුව තිබිය යුතුය.

05. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය වන සුදුසුකම් අතර පහත සඳහන් සුදුසුකම් ඇතුළත් වේ.
    - අ) පසුගිය වසර පහ තුළ සිදු කරන ලද සාමාන්‍ය වාර්ෂික ඉදිකිරීම් වැඩ ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් මිලියන 195 කට නොඅඩු විය යුතුය.
    - ආ) පසුගිය වසර 5 තුළ ලංසුකරුවන්ගේ ශුද්ධ වටිනාකම (net worth) ධන අගයක් (positive) ගත යුතුය.
    - ඇ) පසුගිය වසර 10 ඇතුළත, මාස 12 ක් ඇතුළත අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 150 ක ව්‍යාපෘති වටිනාකමක් සහිත සමාන ස්වභාවයේ සහ සංකීර්ණත්වයකින් යුත් ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක්වත් ප්‍රධාන කොන්ත්‍රාත්කරුවෙකු ලෙස සාර්ථකව නිම කර තිබීම හෝ ඊට සමානුපාතික කාලසීමාවක් තුළ නිම කරන ලද ඉහළ වටිනාකමකින් යුත් ව්‍යාපෘතියක් නිම කර තිබීම.
    - ඈ) මෙම කොන්ත්‍රාත්තුව යටතේ ලබා දිය හැකි කිසිදු අත්තිකාරම් ගෙවීමක් හැර, ද්‍රවශීල වත්කම් (liquid assets) සහ / හෝ ව්‍යාපෘති විශේෂිත ණය පහසුකම්වල අවම ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් මිලියන 33 කට නොඅඩු විය යුතුය.
    - ඉ) කොන්ත්‍රාත්තුව ඉටු කිරීම සඳහා බිල්පත් දත්තවල (Bidding Data) දක්වා ඇති පරිදි සුදුසුකම් ලත් පිරිස් තමා සතු බව ලංසුකරු විසින් පෙන්වා දිය යුතුය.
    - ඊ) ලංසු දත්තවල ලැයිස්තුගත කර ඇති ප්‍රධාන උපකරණ ලබා ගැනීමේ හැකියාව ලංසුකරු විසින් ප්‍රදර්ශනය කළ යුතුය.

06. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු (ගොඩනැගිලි), ප්‍රධාන ඉංජිනේරු (මාර්ග සහ වැඩ) කාර්යාලය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, දුරකථන අංක : 0112693725 වෙතින් ලබා ගත හැකි අතර, 2026.06.12 සිට 2026.07.06 දක්වා වැඩ කරන දිනවල පැය 09.00 සිට පැය 15.00 දක්වා ඉහත දක්වා ඇති ලිපිනයෙන් ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.

07. උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කට් මාවත, කොළඹ 10 වෙත ලිඛිත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසු, ඉංග්‍රීසි භාෂාවෙන් වන සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය. මෙය 2026.06.12 සිට 2026.07.06 දක්වා (නිවාඩු දින හැර) පැය 09.00 සිට පැය 15.00 දක්වා කාලය තුළ රුපියල් 25,000.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් පසුව ලබාගත හැක. මුදලින් කරනු ලබන ගෙවීම් පමණක් පිළිගනු ලැබේ.

08. ලංසු පිටපත් දෙකකින් (in duplicate) යුතුව **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කට් මාවත, කොළඹ 10** යන ලිපිනයට 2026.07.07 දින පැය 14.00 ට හෝ ඊට පෙර භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම සහභාගී වීමට කැමති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදීම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුපත් ඒවා විවෘත කරන දින සිට දින 91 ක් දක්වා වලංගු විය යුතුය.

09. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා රුපියල් ලක්ෂ දහතුනක (රු. 1,300,000.00) ලංසු ඇපකරයක් (Bid-Security) ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරය ලංසු විවෘත කරන දින සිට දින 119 ක් දක්වා වලංගු විය යුතුය.

10. පූර්ව ලංසු රැස්වීම (Pre-Bid Meeting) 2026.06.22 දින පෙ.ව. 10.00 ට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලය, ඕල්කට් මාවත, කොළඹ 10 යන ස්ථානයේදී පැවැත්වීමට නියමිතය. ලංසුකරුවන් හැකිතාක් දුරට ඕනෑම ප්‍රශ්නයක් ලිඛිතව හෝ විද්‍යුත් තැපෑලෙන් පූර්ව ලංසු රැස්වීමට පෙර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා වෙත ලැබීමට සලස්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය, කොළඹ 10.**